4 වන පිටෙන්

නිසා ලැබුණු නිදහසයි. එය බෙහෙවින් අගය කළ යුතු බව සැබෑය. එහෙත් යුද්ධය අවසන් වීම නිසා රට තුළ සැබෑ නිදහස් වාතාවරණයක් ඇතිවූයේද? සැබෑ ලෙසම නිදහසක් අපේක්ෂා කරන ජනයාගේ පිළිතුර නැත යන්නයි. අපට නම් සැබෑ නිදහසක් ඇඟට සේම ඇසටද දැනෙන්නට වූයේ මහින්ද රාජපක්ෂ පාලනය අවසන් වී මෛත්‍රී පාලනයක් බිහිවීමත් සමගය. ඒ නිදහස කෙසේද යත්, විරුද්ධ මත දරන්නන් සුදුවෑන්වලින් පැහැරගෙන යෑම් නැති නිදහසයි. මාධ්‍යවේදීන්ට මරණ තර්ජනය නැති නිදහසයි. රටේ ජනාධිපතිත්, ඔහුගේ පවුලේ අයත් බියෙන් සැකෙන් තොරව විවේචනය කරමින් කතාකිරීමේ ලිවීමේ නිදහසයි. පාලකයාගේ චණ්ඩි නළු ඉරියව් රැගත් කටවුට් පෝස්ටර්වලින් රට වසාගැනීම නිසා ජනතාවගේ දෑස්වලට දැනුණු අප්‍රසන්නතාව නිරන්තරයෙන් උගුරට දැනුනු ඔක්කාරය නැතිවීමෙන් ලැබුණු නිදහසයි. රාජ්‍ය ආයතන, ක්‍රීඩා පිටි, රංගශාලා, මහාමාර්ග, උද්‍යාන ඈ සියලු තැන් වසා සිටි සන්නද්ධ හමුද භට පිරිස් දිවා රෑ දැකීමෙන් සිත්වල අරක්ගෙන තිබුණු භීතිය සහ චකිතය පහව යාමෙන් දැනෙන්නට පටන් ගත් නිදහසයි. හමුදව කඩා පැන ඉන්න හිටින තැනින් කොයි වේලේ එළවා දමා 'මේ භූමිය ආරක්ෂක අමාත්‍යාංශයට අයත් දේපළකි' යනුවෙන් දැන්වීමක් ගසාවිදෝයි ජනයා තුළ පැවති බිය තුරන්වීමෙන් ලැබුණු නිදහසයි. කොතරම් කලක් පවතීදෝයි සහතිකයක් නැතත් මේ නිදහස නිහස් පුරවැසියකු හැටියට ජීවත් වෙන්නට කැමති මට නම් මෛත්‍රී පාලනය යටතේ ලැබුණු අන් සියල්ලටම වඩා වටින්නේය.

## සිදු නොවුණුදේ අතරින් බිඳක්

දැන් අපි මෛත්‍රී පාලනය යටතේ සිදු නොවුණු දේවල් අතර ප්‍රධානම දේ පමණක් සඳහන් කරමු. 'මොනවද වුණේ?' යයි අසන අයගෙන් සියයට අනූපහක් ඒ ප්‍රශ්නය අසන්නේ රාජපක්ෂ පවුල සහ ඔවුන් වටා සිටි මැති ඇමතින් සහ නිලධාරීන් සිදු කළ වංචා දූෂණ සහ අපරාධ සම්බන්ධයෙන් ප්‍රකාශ සටහන් කර ගැනීමෙන් එහාට නීතිමය පියවරක් ගන්නට තවමත් නොහැකිවීම පිළිබඳ කාරණයයි. හයමසකට පමණ පෙර මේ සම්බන්ධයෙන් කතා කරමින් රාජිත සේනාරත්න ඇමතිවරයා 'ආණ්ඩු බලය වෙනස් වුණාට රාජ්‍ය යන්ත්‍රය වෙනස් වුණේ නැතැ'යි කී බවක් අපට මතකය. ඒ වෙනස කර ගන්නට තවමත් නොහැකි වූයේද? අඩුම වශයෙන් එම දූෂණ වංචා අපරාධ පිළිබඳ පරීක්ෂණ පවත්වන ආයතන සහ නීතිපති දෙපාර්තමේන්තුව වැනි තැන්වත් නිසි පරිදි ක්‍රියාත්මක වන තැනකට පත් කර ගන්නට නොහැකි වීද? රනිල්ගේ නායකත්වයෙන් ආණ්ඩුවක් තිබෙන බව ඇත්තක් වුවත් මෙහිදී රටේ ජනාධිපතිවරයා නිදහස් වන්නේ නැත. එම දූෂණ වංචා නාස්ති සහ අපරාධවලට සම්බන්ධ රාජපක්ෂවරුන් ඇතුළු සියලු දෙනාම පාහේ මෛත්‍රී නායකත්වය පවරාගත් පක්ෂයේ සාමාජිකයන් සහ අනුගාමිකයන් වන නිසාත් රාජපක්ෂ පවුල් පාලනය ආරක්ෂා කිරීමට කැපවී ක්‍රියාකළ, ඔහුගේ ඇමති මණ්ඩලයේ සිටි බොහෝ දෙනෙකුට මෛත්‍රීගෙන් ඇමතිකම් ලැබී ඇති නිසාත් එම පරීක්ෂණ දියාරු කිරීමට, කල්යැවීමට සහ චූදිතයන්ට නීතියේ හිල්වලින් රිංගා නිදහස් වීමට ඉඩ සලසා ඇත්ද යන කුකුස මෛත්‍රී පාලනයට හානියකි. තමා ජනාධිපති තනතුරේ බලය පාවිච්චි නොකරන්නේය යන ප්‍රකාශය මෙතැනදී වලංගු නොවේ. මහමැතිවරණයෙන් පරාජය වූවන්ට පවා ඇමතිකම් ලබාදීමේදී පාවිච්චි කෙරුණේ ජනාධිපති තනතුරේ බලය මිස වෙන එකක් නොවේ. අඩුම වශයෙන් හොර හැඳුනුම් පත්වලින් බැංකු ගිණුම් පවත්වාගෙන යාම, හොර ගමන් බලපත්‍ර යොදගෙන විදේශ සංචාර යෑම වැනි චෝදනා ගැනවත් වසරක් ගතවන තුරුත් නීතිය ක්‍රියාත්මක කරන්නට නොහැකිවීම මෛත්‍රී පාලනයේ ගැටලුවකි. මෙවැනි වරදක් සාමාන්‍ය පුරවැසියකුගෙන් සිදුවූයේ නම් සති කීපයක් ඇතුළත ඔහු හෝ ඇය හිරබ-ාරයට පත්වන් ඇත. මේ ගැන කතා කළ මගේ හිතවතෙකු හොරණ පැත්තේ පාසල් දැරියක පොල් ගෙඩි කීපයක් සොරකම් කිරීමේ සිද්ධිය මතක් කළ විට මට අප පත් කරගත් පාලනය ගැනත් අපේ අධිකරණ පද්ධතිය ගැනත් මහත් ලජ්ජාවක් ඇති විය.

## සිදුනොවිය යුතු වූ දේ කවරේද යත්...

මෛත්‍රී පාලනය යටතේ කිසිසේත් සිදු නොවිය යුතු යයි යුත්තිගරුක ජනතාව සිතූ මුත් සිදුවූ එවැනි දේවල් අතරින් දෙකක් පමණක් මෙහි දක්වමු. ජාතික ආණ්ඩුවක මුවාවෙන් ඇමති කම් සංඛ්‍යාව සියයකට කිට්ටු ප්‍රමාණයකට ඉහළ දැමීම ඉන් එකකි. දෙවැන්න තම පවුලේ අයට තනතුරු ලබාදීමෙන් සහ දරුවන් රාජ්‍ය බලයේ රශ්මියෙන් ගොඩනැගෙන්නේය යන චෝදනාව එල්ල වන සේ ක්‍රියා කිරීම අනෙකය. මේ කාරණයේදී කණගාටුවෙන් මතක් කළ යුතු වන්නේ මෛත්‍රීපාල සිරිසේන මහතා ජනාධිපතිවරයා බවට පත්වීමත් සමග තම අල්පේච්ච පැවැත්මෙන් රටට දුන් ආදර්ශයන් වල වටිනාකම මේ කාරණාවෙන් බාල්දු වන බවයි. එ සේ ම පිරිහුණු සමාජයක ඉහළින් දෙන යහපත් ආදර්ශ පහළට ගලා නොයන බවත් වැරදි ආදර්ශ වහාම පහළට ගලන බවත් මෙහිදී ද ඔප්පු වී පෙනෙයි. ජනාධිපති තම සොහොයුරා ටෙලිකොම් සභාපති ලෙස පත් කිරීමේ නරක ආදර්ශය හොඳ දේශපාලන චරිතයක් ලෙස පෙනුණු අර්ජුන රණතුංග දක්වා ගලා යාම එක් නිදසුනකි.

## සිදුවිය යුතු යයි අපට සිතෙන දේ නම්...

මෛත්‍රී පාලනය යටතේ සිදු නොවිය යුතුව තිබුණු එහෙත් සිදුවුණු තව බොහෝ දේ ඇතත් ඉඩකඩ සීමාව සැලකිල්ලට ගෙන අපි අනෙක් කාරණයට හැරෙමු. ඒ සිදු විය යුතු යයි අප සිතන දේ වෙතය. ජනාධිපති මෛත්‍රීගේ පොරොන්දු අතර වඩාත්ව වැදගත් යයි මට සිතෙන්නේ රටේ දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීමේ පොරො-න්දුවයි. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම, මනාප ඡන්ද ක්‍රමය වෙනස් කිරීම, තොරතුරු දැනගැනීමේ පනත සම්මත කර ක්‍රියාවට නැගීම, යනාදිය දේශපාලන සංස්කෘතිය වෙනස්කිරීම හා බැඳුණු ඒවාය. මෙය පරිහානියට පත් සමාජයක් උඩුයටිකුරු කිරීමේ පොරොන්දුවකි. මෙය දේශපාලකයාගේ වත්මන් ප්‍රතිරූපය සම්පූර්ණයෙන් වෙනස් කිරීමේ පොරොන්දුවකි. ඒ අනුව මෙය තම පක්ෂය පූර්ණ ප්‍රතිසංවිධා-නයකට භාජනය කිරීමෙන් තොරව ජනාධිපතිවරයාට ඉටු කළ නොහැකි පොරො-න්දුවකි. දේශපාලකයා ජනතාව නියෝජනය කරන්නෙකු මිස ජනතාවට ඉහළින් වැජ-ඹෙන්නෙකු නොවේ. ගතවූ වසර තුළ ජනාධිපතිවරයා මෙය කීපවරක්ම අවධාරණය කර තිබේ. එහෙත් ඒ අවධාරණයන් තමා නායකත්වය දෙන පක්ෂයේ මැති ඇමතිවරුන්ගෙන් කී දෙනෙක් නම් නිසි බරෙන් යුතුව බාරගෙන ඒ අනුව තම පැවැත්ම වෙනස් කරගෙන ඇත්ද යන්න එතුමා සිතා බැලිය යුතු වෙයි. පුංචි නිදසුනක් දෙකක් ගනිමු. තමාට අතිගරු ජනාධිපති යනුවෙන් අමතන්නට එපා යයි එතුමා අවධාරණයෙන් කියා ඇතත් ඔහුගේ පක්ෂයේ මැති ඇමතීන් කවුරුත් පාහේ තවමත් අමතන්නේ අතිගරු කෑල්ලත් සමගය. (ඒ ඔහුගෙන් තවතවත් දේ ලබා ගැනීම වෙනුවෙන් මිස ඔහු කෙරෙහි ඇති විශේෂ ගෞරවයකින් නොවන බව ඉතා පැහැදිලිය) දෙවැන්න දෙස්තරවරුන් ඇතුළු උසස් නිලධාරීන්ට දෙන අල්ලසක් හැටියට කලක් තිස්සේ ක්‍රියාත්මක වූ තීරුබදු රහිත වාහන බලපත්‍රය අහෝසි කිරීමට අයවැයෙන් යෝජනා කළ විට ශ්‍රී ලංකා නිදහස් පක්ෂහේ මන්ත්‍රීවරු කී දෙනෙක් නම් තමන්ට එම වරප්‍රසාදය එපා යයි කියන්නට ඉදිරිපත් වූයේද? රාජ්‍ය සේවක විශ්‍රාම වැටුප වෙනස් කිරීමට අය-වැයෙන් යෝජනා කෙරුණු විට පස්අවුරුදු සේවා කලයට තමන් වෙත ලැබී ඇති විශ්‍රාම වැටුප් වරප්‍රසාදය ඉවත් කරන්නැයි මන්ත්‍රීවරු කී දෙනෙක් නම් කීවේද? (පාර්ලිමේන්තුවට ඉඳහිට පැමිණ එහි නිදවැටෙමින් සිටියද වසර පහකින් එම විශ්‍රාම වැටුප ලැබෙන බව මෙරට රාජ්‍ය සේ-වයේ කවුරුත් දනිති)

මේ විශ්‍රාම වැටුපද තීරුබදු වාහන බලපත්‍රද, පැමිණීමේ දීමනාද ඇතුළු වරප්‍රසාද සහ කීප-දෙනෙකුටම ලැබී ඇති ඇමතිකම්ද රැකගැනීම වෙනුවෙන් ව්‍යවස්ථාව වෙනස් කිරීම, ඡන්ද ක්‍රමය වෙනස් කිරීම, තොරතුරු දැනගැනීමේ පනත ආදියට මේ අයගේ ඡන්දය ලැබෙනු ඇත. එහෙත් මජර දේශපාලන සංස්කෘතිය නම් එයින් වෙනස් නොවනු ඇත.

වරදන වෙනුවෙන් අත උස්සන මේ මැති ඇමතිවරුන් සමග දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීම යනු සිහිනයක් බව පෙනේ. එහෙත් අප රටේ යහපත් වෙනසක් අපේක්ෂා කරන ජනයා ඒ සිහිනය අත් නොහරින බව ජනාධිපතිතුමා මතකයේ තබා ගැනීම වටී.



## සන්නස Cartoon

